# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014 - නව නිර්දේශය**

**2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල**

**නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය SINH E - 1015**

**පළමුවන කොටසේ ප්‍රශ්නයත්, දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03.00 යි.

---

### I කොටස

① පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් කරන්න.

අව් හුළං වැහි දැරූ, ගැට ගැසී පලුදු වූ
දෙකකුලෙන් සිටි නැඟී, කුඩුවෙන් ඇට ගොඩින්
සැදි ඔබේ සිරුර ඒ, සිඳී බිඳී ඇද වැටී
ලැග වැටී මහ පොළොව වැළඳගත් අයුරු මම
දැන් දකිමි සිත් ඇසින්

වුණි ද ඒ මොහොතෙහි දුක් සුසුම් තාපයක්
නැත; සොවින් අත් මිදුණු සහනයක් සැනසුමක්!

මරණයේ සිනිඳු අත් ගල්වමින් තෙල් සිහිල්
පිරි මැදී යෙද කකුල් ගැට ගැසී පලුදු වූ
ඇට ගොඩලි හන්දිපත් වේදනා දුන් නිතින්
ඒ සිහිල් සෙනෙහසෙහි නො වැතිරී දැයි කියන්

වළ ගැසී සැඟවී ගත් ඒ දෙනෙත් ඇතුළතෙහි
දුක් සුසුම් මතු පැතුම් ඈ දරා උන් හදක්
තිබුණි යයි මම් කෙසේ කොයි ලෙසින් සැක කරම්

දුව බලන්නට ඇවිත්, තබා කද මලු ගෙනා
වැතිර පැදුරෙහි නිද, නැගිට ඇට ගොඩ දරා
පසුව ද නික්ම යන
ඔබ දිරා යන කයයි
මා දෙනෙත් හමු වූයේ
එපමණකි යොමු වූනේ
දැන් වුවත් මා දෙනෙත් දකිනුයේ එපමණයි
ඒ දිරාපත් කයේ, ඇට ගොඩලි හන්දිපත්
මරණයේ සිසිලසින් දැන් නිවී ඇස් පියා
සැනසෙනා අයුරු මැයි මා දෙනෙත් දකිනුයේ

ඒ කෙසේ වේදනාවක් දුකක් විය හැකි ද
වේදනාවක් නොවේ, සැනසුමක් පමණ මැයි

මරණයේ සිනිඳු අත් ගල්වමින් තෙල් සිහිල්
පිරිමදින්නෙද කකුල් ගැට ගැසී පලුදු වූ
ඇට ගොඩලි හන්දිපත් වේදනා දුන් නිතින්
දැන් සුවෙන් ඇස් පියා වැතිර ඉන්නෙද කියන්?

## II කොටස

② "කෙටිකතාකරුවා කලාත්මකවත්, සියුම්වත්, ඒකීභූත ධාරණාවත් මත පිහිටා අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරයි." මේ අදහස නිදසුන් ඇසුරෙන් පහදන්න.

③ පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරයක් කරන්න.

1. සාරධාගේ මංගල්‍යය.
2. පෑදි දියට බොර දිය
3. කරත්තය
4. කැනල් පාරේ නිශාචරයෝ.

④ "නවකතාවක සාර්ථකත්වය රඳාපවතින්නේ ජීවිතයේ අනේකවිධ සංකීර්ණතා යථාර්ථවත් ලෙස නිරූපනය කිරීම මතය." මේ මතයෙහි සත්‍යාසත්‍යතාව නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

⑤ "චරිත තුනක් නවකතාකරුවාගේ පරමාර්ථය වූයේ චරිතයන්හි ක්‍රියාකාරිත්වය උපරිම තලයක රඳවා ගනිමින් මනුෂ්‍ය ස්වභාවය අනාවරණය කිරීමයි" නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

## III කොටස

⑥ මහනුවර යුගයේ ලංකා සමාජයෙහි වෙනස්වීම සිංහල පද්‍ය සාහිත්‍යයේ නවතාව කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් ඇසුරෙන් පහදන්න.

⑦ කොළඹ යුගයේ තරුණ කවීන්ගේ කාව්‍ය නිර්මාණයන්හි දැකිය හැකි විශේෂතා කවරේද? සනිදර්ශනව සාකච්ඡා කරන්න.

⑧ "සෙසු කලා මාධ්‍ය සමග සසඳන කල්හි නාට්‍ය කලාව ස්වීය ලක්ෂණයන්ගෙන් සමන්විත කලාංගයකි." සාකච්ඡා කරන්න.

⑨ "මනමේ නාට්‍යකරුවා මූලාශ්‍රය සමාතික්‍රමණය කරමින් ජීවිත යථාර්ථය වෙත සමීප වීමට උත්සුක වෙයි." මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**********************